**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date. 2025.03.24 |
|---|---|---|

කේ.බී.චන්ද්‍රිකා ප්‍රියදර්ශනී
තුලාවේල්ලිය
මැදවච්චිය

**පැමිණිලිකාරිය**

ඒ.එම්.ආර්.දිලීෂ සංගීත් රූපසිංහ
තුලාවේල්ලිය
මැදවච්චිය

**වින්දිත පාර්ශවය**

1. රෝහණ සමන්ත සේනානායක
   පොලිස් සැරයන් 45411
   පලුගොල්ලෑව, පූනෑව, මැදවච්චිය
   ( දැනට වැඩ තහනමකට ලක්ව ඇත. )

2. එස්.කපිල ජගත් සෙනෙවිරත්න
   පොලිස් කොස්තාපල් 75324
   ඇතාකඩ, ඇටවීරගොල්ල, මැදවච්චිය
   ( දැනට වැඩ තහනමකට ලක්ව ඇත. )

3. පී. විමලසිරි
   ප්‍රධාන පොලිස් පරීක්ෂක
   ස්ථානාධිපති - විවිධ පැමිණිලි අංශය
   පොලිස් ස්ථානය, මැදවච්චිය

4. ආර්.එම්.අයි.බී.රත්නායක
   ප්‍රධාන පොලිස් පරීක්ෂක
   ස්ථානාධිපති
   පොලිස් ස්ථානය, මැදවච්චිය

**වගඋත්තරකරුවන්**


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2505541/74 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය : HRC/ANU/176/2024(A)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කොට සිටින්නේ, මැදවච්චිය පොලිස් වසමේදී තම පුතා වන දිලීෂ සංගීත් රූපසිංහ යන අය විසින් සිය වාහනය පදවාගෙන පැමිණෙමින් සිටියදී ඔහුගේ වාහනය නවත්වා ඔහුව අත්අඩංගුවට ගෙන පොලිස් සැරයන් 45411 සේනානායක හා පොලිස් කොස්තාපල් 75324 කපිල යන දෙදෙනා විසින් ඔහුගේ අත්දෙක බැද පහරදී තුවාල සිදුකර ඇති බවත්, මෙමගින් තම පුතාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් ය.

**වින්දිත පාර්ශවය වන දිලීෂ සංගීත් රූපසිංහ යන අයගේ ප්‍රකාශය**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.04.17 වන දින වින්දිත පාර්ශවය වන දිලීෂ සංගීත් රූපසිංහ යන අයගෙන් ඔහුගේ අත්අඩංගුවට ගැනීම හා පහරදීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, මෙකී ප්‍රකාශය මගින් දිලීෂ සංගීත් රූපසිංහ යන අය ප්‍රකාශ කර සිටින්නේ, 2024.04.07 වන දින තමා උදේ 10.00ට පමණ මැදවච්චිය නගරය වෙත යාම සඳහා තමාගේ නමින් ඇති අංක PT 9660 දරණ ඩිමෝ බට්ටා වර්ගයේ ලොරි රථයෙන් තම යහළුවෙකු සමඟ පිටත්ව ගිය බවත්, වාහනය තමා පදවා ගෙන ගිය බවත් ය.

එසේම, මැදවච්චිය නගරයට ගොස් අරක්කු භාගයක් මිලට ගත් බවත්, එය ලොරියට දමා ගත් බවත්, තවත් අරක්කු භාගයක් ගත් බවත්, එම අරක්කු භාගය යහළුවා සමඟ පානය කළ බවත්, එලෙස මත්පැන් පානය කොට නැවත ලොරි රථයෙන් ගෙදර එන විට මැදවච්චිය පොඩි ඉස්කෝලය ඉදිරිපිට රථවාහන රාජකාරියේ පොලිස් නිලධාරීන් දෙදෙනෙක් රාජකාරී කරමින් සිටි බවත්, තමා පැදවූ ලොරි රථය ඔවුන් පසුකර ඉදිරියට පැමිණි බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

එමෙන්ම, තමා ලොරි රථයේ පැති කණ්ණාඩියෙන් පසුපස බලන විට රථවාහන රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් දෙදෙනෙක් යතුරු පැදියෙන් පැමිණෙනු දුටු බවත්, ඔවුන් දෙදෙනා පැමිණ තමා පැදවූ ලොරි රථය පසුකර යතුරුපැදිය ඉදිරියෙන් නැවැත්වූ බවත්, එවිට තමා ද පදවාගෙන ආ තම ලොරි රථය නැවැත්වූ බවත්, එලෙස ලොරි රථය නැවැත්වූයේ විරාල් මුරිප්පුව ගමේ ඇති වතුර ටැංකිය අසල බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත. තවද, එම ස්ථානයේ කඩමණ්ඩියක් තිබූ බවත්, ගමේ මිනිසුන් එහි සිටි බවත්, පැමිණි පොලිස් නිලධාරීන් දෙදෙනාගෙන් එක් අයෙකු තමා සිටි රියදුරු අසුන පැත්තට ඇවිත් තමා වාහනයෙන් ඇද පිටතට ගත් බවත්, එම අවස්ථාවේදී එකී පොලිස් නිලධාරියාගේ නිල කමිසයේ ගැට ගසා තිබූ පටියක් ගලවා තමාගේ අත්දෙක පිටුපසට කර ගැට ගසන ලද බවත්, තමාගේ යහළුවා එම අවස්ථාවේ ලොරි රථයේ ඉදිරිපස අනෙක් අසුනේ වාඩි වී සිටි බවත් වින්දිත පාර්ශවය විසින් දක්වා ඇත.

පසුව එකී පොලිස් නිලධාරියා විසින් ඔහුගේ අතින් තමාගේ බෙල්ලේ පිටුපස ප්‍රදේශයට පහර කිහිපයක් ගසන ලද බවත්, අනතුරුව තමා වාහනය ළඟට ගෙන වාහනයේ මුහුණත ප්‍රදේශයට හේත්තු කර දණහිස නවා තමාගේ කොන්ද සහ යටිබඩ ප්‍රදේශයට පහර කිහිපයක් ගසන ලද බවත් වින්දිත පාර්ශවය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත. අනතුරුව ඔහු සමඟ පැමිණි අනෙක් පොලිස් නිලධාරියා ද තමා අසලට පැමිණි බවත්, ඔහු විසින් අතින් තම ඔළුවට පහරක් ගැසූ බවත්, ඉන්පසු තමා බිම වැටුණු බවත්, එවිට ඔහු පා පහර කිහිපයක් තම බඩට සහ කකුල් ප්‍රදේශයට එල්ල කළ බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, තමාට පහර දුන් පොලිස් නිලධාරීන් දෙදෙනා අතරින් පළමුව පහරදුන් පොලිස් නිලධාරියා විසින් තමාව නැගිට්ටුවා තම ලොරි රථයේ රියදුරු අසුනට අනෙක් පස ඇති දොර අසලට රැගෙන ආ බවත්, එසේ රැගෙනවිත් තමා එම දොර ළඟ ඇති අසුනට තල්ලු කළ බවත්, එම අවස්ථාවේදී එම අසුනේ තම යහළුවා නොසිටි බවත්, තමා හට වාහනයේ අසුනට යාමට නොහැකි වූ බවත්, එවිට එම පොලිස් නිලධාරියා තමාව ලොරි රථයේ දොර හා අසුන අතරට තබා ලොරි රථයේ දොර තද කළ බවත්, ඉන්පසුව තමාගේ කොණ්ඩයෙන් අල්ලා ඇද නැවත අසුනට තල්ලු කළ බවත්, එවිට තමා අසුනට තල්ලු වූ බවත්, පසුව එම පොලිස් නිලධාරියා විසින් ලොරි රථයේ දොර වසා ලොරි රථය පන ගැන්වීමට කටයුතු කළ ද, ලොරි රථය පනගන්වා ගත නොහැකි වූ නිසා රථය තල්ලු කර පන ගන්වන ලද බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

අනතුරුව මැදවච්චිය පොලිස් ස්ථානයේ ත්‍රීරෝද රථයක් එම ස්ථානයට පැමිණි බවත්, තම යහළුවා එම ත්‍රීරෝද රථයේ දමාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත්, එම ත්‍රීරෝද රථයේ සිටි පොලිස් නිලධාරීන් විසින් ඔවුන් අත තිබූ පොලුවලින් යහළුවාට පහරදෙනු දුටු බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, තම ලොරි රථයෙන් තමා පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත්, වාහනය පදවාගෙන ආවේ තමාට පළමුව පහරදුන් පොලිස් නිලධාරියා වන බවත්, පොලිස් ස්ථානය වෙත ගෙනවිත් තමාව සිර මැදිරියට දමන ලද බවත්, පසුව තමාගේ යහළුවා ද සිර මැදිරියට දමන ලද බවත්, තමා පොලිස් ස්ථානයට රැගෙන එන විට සවස 6.30 පමණ වී තිබූ බවත් වින්දිත පාර්ශවය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, තමා පොලිස් ස්ථානය වෙත රැගෙන එනවිට තමාගේ වෘෂණ කෝෂ ප්‍රදේශයේ දැඩි වේදනාවක් තිබුණු බවත්, එම නිසා උපසේවය භාර නිලධාරියාට ඒ බව දැනුම්දුන් බවත්, එවිට අමාරු ප්‍රදේශය ඔහුට පෙන්වන ලෙසට කළ දැනුම්දීම මත අදාළ ස්ථානය පෙන්වන ලද බවත්, එවිට ඔහු ස්ථානාධිපතිවරයාට දුරකථනයෙන් ඒ පිළිබඳව දැනුම්දුන් බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත. පසුව උපසේවය භාර නිලධාරියා පැමිණ තමාව රෝහල්ගත නොකරන ලෙසට ස්ථානාධිපතිවරයා විසින් උපදෙස් ලබාදුන් බව පැවසූ බව ද ප්‍රකාශ කර ඇත.

එහෙත් තමාට දැඩි වේදනාවක් ඇති බැවින් තමා කෑ ගසමින් සිටි බවත්, පැය එක හමාරකට පමණ පසු පොලිස් නිලධාරීන් විසින් තමාව මැදවච්චිය රෝහලට රැගෙන ගිය බවත්, මැදවච්චිය රෝහලෙන් තමාව වහාම අනුරාධපුර රෝහලට මාරු කර යවන ලද බවත් වින්දිත පාර්ශවය විසින් තවදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**</u>

<u>**1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 රෝහණ සමන්ත සේනානායක යන අයගේ කරුණු දැක්වීම**</u>

පොලිස් සැරයන් 45411 සේනානායක යන අය ප්‍රකාශ කර සිටින්නේ, 2024.04.07 වන දින ස්ථානාධිපතිගේ නියෝග පරිදි මැදවච්චිය පොලිස් වසමේ රථවාහන රාජකාරී සඳහා පැය 14.00 සිට පැය 22.00 අතර යොදවා තිබූ බවත්, එදින පැය 16.00ට මැදවච්චිය ප්‍රාථමික විදුහල ඉදිරිපිට තමා සමඟ 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල යන අය ද රාජකාරී කළ බවත් ය. එලෙස රාජකාරීකරමින් සිටියදී පැය 16.00ට පමණ මැදවච්චිය දෙස සිට මන්නාරම් පාරේ ඩීමෝ බට්ටා වර්ගයේ වාහනයක් පැමිණි බවත්, එම වාහනය නතර කරන ලෙසට තමා සංඥා කළ බවත්, නමුත් සංඥාව නොතකා වාහනය ඉදිරියට ධාවනය වූ බවත්, මැදවච්චිය දූෂණ මර්ධන අංශයේ ත්‍රීරෝද රථය ද මෙම වාහනය පිටුපසින් පැමිණි බවත්, මෙකී වාහනය සංඥා නොතකා ධාවනය වූ බැවින් වාහනය පිළිබඳව සැක සිතී වාහනය පරීක්ෂා කිරීම සඳහා වාහනය පිටුපස තමා, 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල සමඟ යතුරු පැදියෙන් ගිය බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේවුවද, එම වාහනයේ සිටි අය පොලිස් නිලධාරීන් දැක වේගයෙන් වාහනය ධාවනය කළ බවත්, එලෙස කිලෝ මීටර් 09ක් පමණ ගොස් අතුරු මාර්ගයකට හැරවීමේදී වාහනය එම ස්ථානයේ නතර වූ බවත්, වාහනය නතර වූ පසු වාහනයේ රියදුරු අසුන දෙසට තමා ගිය බවත්, වාහනයේ අනෙක් අසුන අසලට 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල ගිය බවත්, එලෙස යන විට වාහනයේ සිටි රියදුරු විසින් රිය සහයක සිටි අසුන පැත්තට පැන යන්න හැදූ බවත්, එවිට තමා රියදුරු අසුනේ සිට ඔහුගේ එක කකුලකින් අල්ලා ගත් බවත් 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

එම අවස්ථාවේදී වාහනයේ රියදුරු, වාහනයේ ගියර් ලීවර් එක උඩට වැටුණු බවත්, පසුව ඔහුව ඇද වාහනයෙන් එළියට ගත් බවත්, එවිට ඔහුට මොනවාහරි වුණාද කියන්න දන්නේ නැති බවත්, ඔහුව පාලනය කර ගැනීම සඳහා ඔහුගේ අත්දෙක පිටුපසට කර තම නිල ඇඳුමේ සවිකර තිබූ ලෙනාඩ් එකෙන් බඳින ලද බවත් 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. පසුව මොහු විසින් සිදුකරන ලද වරද කියාදී අත්අඩංගුවට ගත් බවත්, මොහුට ඇති චෝදනාවන් වූයේ බීමත්ව රිය පැදවීම, රියදුරු බලපත්‍රයක් නොමැතිව රිය පැදවීම, අපරීක්ෂාකාරී රිය පැදවීම, පොලිස් අණ නොතකා ධාවනය කිරීම බවත් 1 වන වගඋත්තරකරු විසින් තවදුරටත් සඳහන් කර ඇත.

ඉන් අනතුරුව තමා එම වාහනය පදවාගෙන සැකකරු පොලිස් ස්ථානය වෙත රැගෙන පැමිණි බවත්, සැකකරු ඉදිරි අසුනේ සිටි බවත්, සැකකරු රැගෙනවිත් බීමත් බව පරික්ෂා කිරීම සඳහා ශ්වසන නාල පරික්ෂණය සිදුකළ බවත්, එම සැකකරු අත්අඩංගුවට ගැනීමේදී ඔහුට කිසිදු පහරදීමක් සිදුනොකළ බවත් 1 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**<u>2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 එස්.කපිල ජගත් සෙනෙවිරත්න යන අයගේ කරුණු දැක්වීම</u>**

පොලිස් කොස්තාපල් 75324 කපිල ජගත් සෙනෙවිරත්න යන අය ප්‍රකාශ කර සිටින්නේ, 2024.04.07 වන දින 1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක සමඟ පැය 14.00 සිට පැය 22.00ට දක්වා අතුරු මාර්ගවල රථවාහන යතුරුපැදි රාජකාරී හා සංචාරක රාජකාරීවල යෙදුනු බවත්, මෙදින පැය 16.00ට පමණ මැදවච්චිය ප්‍රාථමික විදුහල ඉදිරිපිට රාජකාරී කරමින් සිටියදී මැදවච්චිය දෙස සිට පැමිණි ඩිමෝ බට්ටා වර්ගයේ ලොරි රථයක් නවත්වන ලෙසට පොලිස් සැරයන් 45411 සේනානායක විසින් සංඥා කළ බවත්, එම ලොරි රථය සංඥාව නොතකා ධාවනය වූ බවත්, එසේහෙයින් එම වාහනය පිළිබඳව සැක සිතී තමා සහ පොලිස් සැරයන් 45411 සේනානායක විසින් එම වාහනය පසුපස යතුරු පැදියෙන් ගිය නමුත්, වාහනය නොනවත්වා වේගයෙන් ධාවනය වූ බවත් ය.

එලෙස වේගයෙන් ධාවනය වීමේදී ලොරි රථයේ වම්පස දොරෙන් බෝතලයක් විසි කරනවා දුටු බවත්, ලොරි රථය වේගයෙන් ගොස් අතුරු මාර්ගයකට හැරවීමේදී වාහනයේ වේගය අඩුවුණු බවත්, එවිට නිලධාරීන් ගිය යතුරුපැදිය ඉස්සර කර නවත්වා ලොරි රථය නවත්වා ගන්නා ලද බවත් 2වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. පසුව පොලිස් සැරයන් 45411 සේනානායක විසින් ලොරි රථය අසලට ගොස් රියදුරු අසුන ළඟ දොර විවෘත කළ බවත්, එවිට ලොරි රථයේ වම්පස අසුනෙහි සිටි අය දොර ඇරගෙන දිවීමට උත්සාහ කළ බැවින් තමා ඔහුව අල්ලා ගන්නා ලද බවත්, එම අවස්ථාවේදී දූෂණ මර්ධන අංශයේ ත්‍රීරෝද රථය ද එම ස්ථානය වෙත පැමිණි බවත්, වයි හන්දියේදී ලොරි රථයෙන් පිටතට විසි කරන ලද බෝතලය තුළ නීතිවිරෝධි මත්පැන් තිබුණු බැවින් එය ඔවුන් භාරයට ගත් බව එලෙස පැමිණි දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් විසින් දැනුම්දුන් බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, ලොරි රථය පැදවූ අය බීමත්ව සිටි අතර, බීමත්ව රිය පැදවීම, රියදුරු බලපත්‍රයක් නොමැතිව රිය පැදවීම, අණනොතකා රිය ධාවනය කිරීම, අපරික්ෂාකාරීව රිය ධාවනය කිරීම යන චෝදනාවන් යටතේ ඔහුව පොලිස් සැරයන් 45411 සේනානායක යන අය විසින් අත්අඩංගුවට ගත් බවත්, පසුව සැකකරු ලොරි රථයේ වම් අසුනට නංවාගෙන පොලිස් සැරයන් 45411 සේනානායක විසින් ලොරි රථය පදවාගෙන සැකකරු මැදවච්චිය පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත්, තමා යතුරු පැදියෙන් පොලිස් ස්ථානය වෙත පැමිණි බවත්, තමා මෙම වැටලීමට සහභාගී වූ නමුත්, තමා මෙම සැකකරුට හෝ ලොරි රථයේ රිය සහයකට කිසිදු පහරදීමක් සිදුනොකළ බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

## 3 වන වගඋත්තරකරු වන ප්‍රධාන පොලිස් පරීක්ෂක පී. විමලසිරි යන අයගේ කරුණු දැක්වීම

3 වන වගඋත්තරකරු විසින් අංක OW/759/24 සහ 2024.05.05 දිනැති වාර්තාව යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2024.04.07 වන දින පැය 18.00 සිට පැය 06.00 දක්වා රථවාහන පාලන හා මාර්ග ආරක්ෂක රාජකාරි වල යෙදී සිටි පො.සැ. 45411 සේනානායක සහ පො.කො. 75324 කපිල යන නිලධාරීන් මැදවච්චිය ඒ 14 මන්නාරම් ප්‍රධාන මාර්ගයේ ප්‍රාථමික විදුහල ඉදිරියේ රථවාහන රාජකාරි වල යෙදී සිටියදී මැදවච්චිය නගරය දෙස සිට වයි හන්දිය දෙසට ධාවනය කළ අංක NCPT 9660 දරණ කළුපාට ඩීමෝ වර්ගයේ බට්ටා ලොරි රථයක් නවත්වන ලෙසට මෙම නිලධාරීන් විසින් අතින් සහ නලාව නාද කර සංඥා කර ඇති බවත්, එම ලොරි රථයේ රියැදුරු රථය නැවැත්වීමට පැමිණ නැවත එකවරම රථයේ වේගය වැඩි කර ඇති බවත් ය. මැදවච්චිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ ත්‍රීවීල් රථයේ ගමන් කළ නිලධාරීන් ද එම ලොරි රථය සංඥා නොතකා නොනවත්වා ධාවනය කළ බව දැක ඇති අතර, ඔවුන් ද එම ලොරි රථය පසුපස ගොස් ඇති බවත්, ත්‍රීවීල් රථය පසුපස පො.කො. 75324 කපිල නිලධාරියා පුද්ගලික යතුරුපැදියෙන් ගමන් කරමින් ලොරි රථය ලුහුබැඳ ගොස් ඇති බවත් 3 වන වගඋත්තරකරු විසින් ඉහත කී වාර්තාවේ සඳහන් කර ඇත.

ඉන් අනතුරුව අදාළ ලොරි රථය වල්පොළ හන්දියේ සිට කුලික්කඩ දෙසට ඇති අතුරු මාර්ගය දිගේ විරාල්මුරිප්පුව ප්‍රදේශයට ගොස් කුළික්කඩ ජල පිරිපහදුව අසළ ඇති වම් පැත්තේ අතුරු මාර්ගයේ මීටර් 50ක් පමණ යනවිට ලොරි රථයේ යම් ආපදාවක් නිසා එය නතර වී ඇත. ඒ සමගම එම රථය අසළට රථවාහන රාජකාරි කරමින් සිටි නිලධාරීන් ගොස් ඇති බවත්, එම රථයේ රියැදුරු ලොරි රථයෙන් බිමට බැසීමේදී එකවර මාර්ගයේ දකුණු පැත්තේ ඇති මානාගොල්ල දෙසට වැටී ඇති බවත්, පසුව එම රියැදුරු කලහකාරී ලෙස හැසිරී ඇති බවත්, ඔහු කෙලින් සිටගෙන සිටීමට පවා නොහැකි ආකාරයට මත්පැන් පානය කර සිට ඇති බවත්, නිලධාරීන් විසින් ඔහුව පාලනය කර ගැනීමෙන් පසුව බීමත්ව රිය පැදවීම සහ පොලිස් අණ නොතකා ධාවනය කිරීම යන වරදවල් කියාදී අත්අඩංගුවට ගෙන ඔහු පැදවූ NCPT 9660 දරණ ඩීමෝ වර්ගයේ ලොරි රථයෙන් පොලිස් ස්ථානය වෙත රැගෙන පැමිණ ඇති බවත් 3 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, අදාළ ස්ථානයට පැමිණි දූෂණ මර්ධන අංශයේ ත්‍රීවීල් රථයෙන් ලොරි රථයේ රිය සහායක පොලිස් ස්ථානය වෙත රැගෙනවිත් ඇත. පසුව උපසේවා රාජකාරියේ යෙදීසිටි පො.කො. 57319 දිසානායක නිලධාරියාගෙන් ඇල්කොලයිසර් නලයක් ලබාගෙන එය පරික්ෂා කර එහි වලංගු කාලය 2025/4 ලෙසද ලොට් අංකය ලෙස SRI 2022 යනුවෙන් සඳහන් කර ලොරි රථයේ රියැදුරු රථවාහන අංශයට රැගෙනවිත් පැය 17.50ට බැලුම් පරික්ෂාව සිදු කර ඇති බවත්, පරික්ෂාවෙන් පසුව නලය පරික්ෂා කිරීමේදී ඇතුළත ඇති කහපාට රසායනික ද්‍රව්‍ය කොළ පැහැ ගැන්වී නලයේ සළකුණු කර තිබූ කළුපාට ඉර පසුකර ගොස් ඇති නිසා බීමත් රියැදුරුගේ රුධිරයේ මිලිලීටර් 100ක ඇල්කොහොල් ග්‍රෑම්ස් 0.08ට වැඩි බව අනාවරණය වූ බවත්, ඒ අනුව රියැදුරු වන අජිත් මානෙල් රූපසිංහගේ දිලීෂ සංගීත් යන අයට විරුද්ධව බීමත්ව රිය පැදවීම, පොලිස් අණ නොතකා ධාවනය, අපරික්ෂාකාරී ලෙස රිය පැදවීම, රියැදුරු

බලපත්‍රයක් නොමැතිව ධාවනය යන වරදවල් සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇති බවත් 3 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ඉහත කී වාර්තාව තුළ සඳහන් කර ඇත.

**<u>4 වන වගඋත්තරකරු වන ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්.එම්.අයි.බී.රත්නායක යන අයගේ කරුණු දැක්වීම</u>**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා ප්‍රකාශ කර සිටින්නේ, 2024.04.07 වන දින තමා රාජකාරී කළ බවත්, හදිසියේ තම දියණිය අසනීප වූ බැවින් දියණිය බැලීම සඳහා සහකාර පොලිස් අධිකාරී වෙත දන්වා එදින දවල් 12.00ට තමා රාගම බලා පිටත් වූ බවත්, තමා පිටවීමේ සටහන් යොදා නොමැති බවත්, සහකාර පොලිස් අධිකාරීවරයාට දන්වා නිවාඩු සඳහා අවසර ලබා ගත් බැවින් ගමන සඳහා පිටව ගිය බවත්, වැඩ බැලීම සඳහා 3 වන වගඋත්තරකරු වන ප්‍රධාන පොලිස් පරීක්ෂක විමලසිරි වෙත උපදෙස් ලබාදුන් බවත් ය.

එදින තමා ගමන් කරමින් සිටින අතරතුරදී උපසේවය භාර පොලිස් සැරයන් 57319 දිසානායක විසින් දුරකථන ඇමතුමක් ලබා ගනිමින් අත්අඩංගුවට ගෙන සිරි මැදිරියේ රඳවා සිටින අයෙකුට අසනීප බැවින් ඔහුට කුමක් කරන්නේද යන්න විමසූ බවත්, එම අවස්ථාවේදී අසනීප තැනැත්තා රෝහල් ගත කරන ලෙස තමා දැනුම් දුන් බවත් ස්ථානාධිපතිවරයා විසින් සඳහන් කර ඇත. එසේවුවද පහරදීමක් පිළිබඳව තොරතුරු තමාට නොදැන්වූ බවත්, දිලීෂ සංගීත් රූපසිංහ යන අය සම්බන්ධයෙන් තමාගෙන් කිසිදු වරදක් සිදු වී නොමැති බවත් වැඩිදුරටත් ස්ථානාධිපතිවරයා විසින් ප්‍රකාශ කර ඇත.

**<u>2024.04.07 වන දින උපසේවය භාර පොලිස් නිලධාරී පොලිස් කොස්තාපල් 57319 පී.බී.දිසානායක යන අයගේ ප්‍රකාශය</u>**

වින්දිත පාර්ශවය වන දිලීෂ සංගීත් රූපසිංහ යන අයට සිදුවූ පහරදීම හේතුකොට ගෙන ඇඩි වේදනාවෙන් පසුවන අවස්ථාවේදී ඔහු රෝහල්ගත කරන ලෙසට උපසේවය භාර නිලධාරියා වෙතින් කරන ලද ඉල්ලීම අනුව එය ඉටුකිරීමට උපසේවක කටයුතු නොකිරීමත්, ස්ථානාධිපතිවරයා විසින් වින්දිත පාර්ශවය රෝහල්ගත නොකරන ලෙසට උපදෙස් ලබාදීම හේතුවෙන් රෝහල්ගත නොකළ බවට උප සේවය භාරව සිටි නිලධාරියා සිදු කර ඇති ප්‍රකාශය පදනම්ව අදාළ අත්අඩංගුවට ගැනීම සිදු වූ 2024.04.07 වන දින උප සේවය භාරව කටයුතු කළ පොලිස් කොස්තාපල් 57319 පී.බී. දිසානායක යන අයගෙන් ප්‍රකාශයක් සටහන් කරගැනීමට කොමිෂන් සභාව විසින් කටයුතු කර ඇත.

පොලිස් කොස්තාපල් 57319 පී.බී.දිසානායක යන අය විසින් ප්‍රකාශ කර සිටින්නේ, 2024.04.07 වන දින පැය 17.50ට උපසේවා රාජකාරී භාර ගන්නා ලද බවත්, මෙදින කාර්යභාර නිලධාරී ලෙස පොලිස් සැරයන් විජයරත්න කටයුතු කළ බවත්, මෙදින සිර මැදිරි 01 හා 02 තුළ සැකකරුවන් රඳවා සිටින ලද බවත් ය. උප සේවය භාරව සිටි තමා විසින් සැකකරුවන් කිහිප දෙනෙකුට ඇප ලබා දෙමින් සිටියදී 1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක විසින් සැකකරුවන් දෙදෙනෙකු රැගෙන ආ බවත්, ඉන් එක් අයෙකු රථවාහන වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන තිබූ ඒ.එම්.ආර්.දිලීෂ

සංගීත් වන පැමිණිලිකරු වන බවත්, එකී තැනැත්තා සම්බන්ධයෙන් සටහන් ඇතුලත් කර තමාට භාරදුන් බවත්, එවිට වේලාව රාත්‍රී 7.30ට පමණ වූ බවත් ය. ඉහත කී සැකකරු භාරදෙන විට ඔහුගේ උඩුකය විවෘතව තිබූ බවත්, බෙල්ලේ සිරීම් තුවාල සහිතව ලේ වහනය වන බව දුටු බවත්, එම තුවාල පිළිබඳව රථවාහන අංශයේ තොරතුරු පොතට ඇතුලු කර සැකකරු භාරගත් බවත්, ස්ථානාධිපති නියෝග ලැබෙනතෙක් අංක 01 සිර මැදිරියේ රඳවා තැබූ බවත් පොලිස් කොස්තාපල් 57319 පී .බී. දිසානායක යන නිලධාරියා විසින් සඳහන් කර ඇත.

ඉන් අනතුරුව තම දෛනික රාජකාරී ඉටුකරමින් සිටින විටදී මෙම සැකකරු සමඟ සිටි තවත් අයෙකු තමා වෙත ගෙනවිත් භාරදුන් බවත්, ඔහුව භාර දුන්නේ උප පොලිස් පරික්ෂක මධුසංඛ යන අය වන බවත්, ඔහුවද පරික්ෂා කරන විට ඔහුගේ ශරීරයේ උඩු කයේ සීරීම් තුවාල තිබූ බවත්, ඒ පිළිබඳව වැටලීම් රාජකාරී කටයුතු සිදුකරනු ලබන තොරතුරු සටහන් පොතේ සටහන් කර තැබූ බවත් ප්‍රකාශ කර ඇත. එසේම, එදින  රාත්‍රී 9.00 ට පමණ  අංක 01 සිර මැදිරියේ සිටි දිලීෂ සංගීත් යන අය තමාට කතා කළ බවත්, ඔහුගේ යටිබඩ රිදෙන බව තමාට පවසා සිටි බවත්, පසුව තමාගේ විදුලි පන්දම ආධාරයෙන් ඔහුගේ යටි බඩ ප්‍රදේශය පරික්ෂා කළ බවත්, එවිට ඔහුගේ වම්පස වෘෂණ කෝෂය දිවුල් ගෙඩියක් තරම් ඉදිමී තිබූ බව දුටු බවත්, මේ පිළිබඳව කාර්යභාර නිලධාරී පොලිස් සැරයන් 45941 දැනුවත් කරන ලද බවත් දක්වා ඇත.

පසුව තමාගේ ජංගම දුරකථනයෙන් 4 වන වගඋත්තරකරු වන ස්ථානාධිපතිවරයාගේ රාජකාරී දුරකථනයට ඇමතුමක් ගෙන සැකකරුගේ රෝගී තත්ත්වය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් පතන ලද නමුත්, ස්ථානාධිපතිවරයා විසින් සැකකරු රෝහල්ගත කරන ලෙසට උපදෙස් ලබානොදුන් බවත්, ටික වේලාවකින් සැකකරු හයියෙන් කෑ ගැසීමට පටන් ගත් බවත්, පසුව කාර්යභාර නිලධාරී පොලිස් සැරයන් 45941 නිලධාරියාට දන්වා 3 වන වගඋත්තරකරු වන වැඩ බලන ප්‍රධාන පොලිස් පරික්ෂක විමලසිරි මහතා වෙත මේ පිළිබඳව දැනුම්දෙන ලද බවත්, ඔහුද මෙම සැකකරු රෝහල්ගත කරන ලෙසට උපදෙස් ලබාදුන්නේ නැති බවත්, පසුව රාත්‍රී 10.20ට පමණ 025-2245622 දරණ කාර්යාලීය දුරකථනය වෙත ඇමතුමක් ගෙන 4 වන වගඋත්තරකරු වන ස්ථානාධිපතිවරයා විසින් කාර්යභාර නිලධාරියාට  සැකකරුව රෝහල්ගත කරන ලෙස දන්වා තිබූ බවත්, ඒ අනුව සැකකරු රෝහල්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ බවත් පොලිස් කොස්තපල් 57319 පී.බී. දිසානායක නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

**2024.04.07 වන දින දූෂණ මර්ධන අංශයේ රාජකාරී කරන ලද උප පොලිස් පරික්ෂක දිනේෂ් මධුසංඛ යන අයගේ ප්‍රකාශය**

2024.04.07 වන දින දූෂණ මර්ධන අංශයේ රාජකාරී කරන ලද උප පොලිස් පරික්ෂක ඒ.දිනේෂ් මධුසංඛ ඇතුළු නිලධාරින් කණ්ඩායම ස්ථානාධිපතිගේ නියෝග පරිදි ත්‍රීරෝද රථයෙන් දූෂණ මර්ධන රාජකාරී සඳහා පිටත්ව ගිය බවත්, ඔවුන් රාජකාරී කරමින් සිටින අතරතුරදී මැදවච්චිය ප්‍රාථමික විද්‍යාල ඉදිරිපිට නිලධාරීන් රථවාහන රාජකාරී කරනු  දුටු බවත්, එවිට වේලාව ප.ව.3.45 – 4.00 වූ බවත් ප්‍රකාශ කර ඇත.

එම අවස්ථාවේ තම ත්‍රීරෝද රථය පසු කරමින් වේගයෙන් බට්ටා ලොරියක් ධාවනය වූ බවත්, එම ලොරිය නවත්වන ලෙසට රථවාහන රාජකාරී සිදු කළ නිලධාරීන් සංඥා කළ බව දුටු බවත්, සංඥා නොතකා රිය ධාවනය වූ බවත්, ඒ අනුව තම නිලධාරීන් ගමන් ගත් ත්‍රීරෝද රථයෙන් එම ලොරි රථය පසුපස ගිය බවත් උප පොලිස් පරීක්ෂක දිනේෂ් මධුසංඛ නිලධාරියා විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාවේදී රථවාහන රාජකාරී සිදු කළ 1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 හා 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 යන නිලධාරීන් මෙම ලොරි රථය පිටුපසින් යතුරු පැදියකින් ගිය බවත්, මෙලෙස වේගයෙන් යන විට ලොරි රථයේ වම්පස අසුනේ සිටි අය බෝතලයක් විසි කරනවා දුටු බවත්, දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් ගමන්ගත් ත්‍රීරෝද රථය නවත්වා එම බෝතලය පරීක්ෂා කළ බවත්, එහි නීතිවිරෝධී මත්පැන් තිබූ බවත් උප පොලිස් පරීක්ෂක දිනේෂ් මධුසංඛ නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, ලොරි රථය වේගයෙන් ධාවනය වූ නිසා ඔවුන්ට මග හැරුණු බවත්, නැවත පාරේ සිටි මිනිසුන්ගෙන් අසා යන විට අදාළ ලොරි රථය රථවාහන රාජකාරී සිදු කළ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බව දුටු බවත්, අත්අඩංගුවට අරගෙන සිටි අය ළගට ගොස් ඔවුන් අතරමගදී ලොරි රථයෙන් විසි කළ බෝතලය පෙන්වා මෙය ඔවුන්ගේ නේද කියා ඇසූ බවත්, එවිට ඔවුන් එය පිළිගත් බවත්, ඔවුන් වරද පිළිගත් බැවින් නීතිවිරෝධී මත්පැන් සන්තකයේ තබා ගැනීමේ වරද කියා දී ලොරි රථයේ රිය සහයක අත්අඩංගුවට ගත් බවත් උප පොලිස් පරීක්ෂක දිනේෂ් මධුසංඛ නිලධාරියා විසින් සඳහන් කර ඇත.

එසේම, මෙම ලොරි රථයේ ගමන් ගත් දෙදෙනා රථවාහන රාජකාරියේ යෙදී සිටි නිලධාරීන් දෙදෙනෙකු භාරයේ සිටි බවත්, ඔවුන්හට එකී නිලධාරීන් විසින් කිසිදු පහරදීමක් සිදුකර නොමැති බවත් උප පොලිස් පරීක්ෂක දිනේෂ් මධුසංඛ නිලධාරියා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ</u>

වින්දිත පාර්ශවය වන ජේ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය ප්‍රකාශ කර සිටින්නේ, 2024.04.07 වන දින තම මිතුරකු සමඟ තම ලොරි රථයෙන් නිවස බලා පැමිණෙන විට රථවාහන රාජකාරීවල යෙදී සිටි පොලිස් නිලධාරීන් දෙදෙනෙකු තම ලොරි රථය පසුපස පැමිණ ලොරි රථය නවතා ලොරි රථයෙන් බස්සවා අමානුෂික ලෙස පහරදී අත්අඩංගුවට ගෙන තම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරන ලද බවයි.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු සමඟ තවත් අයෙකු පොලිස් නිලධාරීන්ගේ අණනොතකා වාහනය ධාවනය කිරීම හේතුකොට ගෙන ඔවුන් ගමන් ගත් රථය හා ඔවුන් පිළිබඳව ඇතිවූ සාධාරණ සැකය හේතුවෙන් ලොරිය පසුපස හබා ගොස් වාහනය නතර කිරීමෙන් පසු ඔවුන් විසින් සිදුකරන ලද වරදවල් සම්බන්ධයෙන් කියා දී අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ

බවත්, වින්දිත පාර්ශවය වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය හට කිසිදු පහරදීමක් සිදුකර නොමැති බවත් ය.

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට ඇති උධෘතයන්ට අනුව 2024.04.07 වන දින පැය 13.30ට ස්ථානාධිපතිගේ නියෝග පරිදි 1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක හා පොලිස් කොස්තාපල් 75324 කපිල යන පොලිස් නිලධාරීන් රථවාහන නිල ඇඳුමින් පැය 14.00 සිට පැය 22.00 දක්වා අතුරු මාර්ගවල යතුරුපැදි සංචාරය සඳහා පිටව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක යන අය විසින් මැදවච්චිය පොලිස් ස්ථානයේ රථවාහන දෛනික තොරතුරු සටහන් පොතේ පිටුව 58 සහ ඡේදය 148 යටතේ යොදා ඇති සටහන අනුව එම නිලධාරියා, 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල යන නිලධාරියා සමඟ මැදවච්චිය ප්‍රාථමික විදුහල ඉදිරිපිට රථවාහන රාජකාරියේ යෙදී සිටියදී මැදවච්චියේ සිට අංක NCPT 9660 දරණ ඩිමෝ වර්ගයේ බට්ටා ලොරි රථයක් පැමිණ ඇති බවත්, මෙම වාහනය පරික්ෂා කිරීම සඳහා වාහනය නතර කරන ලෙසට සංඥා කොට ඇති බවත්, සංඥාව නොතකා වාහනය ධාවනය කොට ඇති බවත්, ඒ අනුව මෙම වගඋත්තරකරුවන් දෙදෙනා වාහනය පසු පස ලුහුබැඳ ගොස් ඇති බවත්, එසේ යන විට ලොරි රථයේ ආපදා තත්වයක් හේතුවෙන් වාහනය නතර වී ඇති බවත් සඳහන් කර ඇති බව පෙනී යයි.

එසේම, ලොරි රථය නතර වූ පසුව වගඋත්තරකරුවන් ඒ අසලට ගිය විට මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය විසින් ලොරි රථයෙන් බැසීමේදී මාර්ගයේ දකුණු පැත්තෙන් ඇති මානා ගොල්ල දෙසට වැටුනු බවත්, පසුව ඔහු කලහකාරී ලෙස හැසිරුණු බවත්, වින්දිත පාර්ශවය හට කෙලින් සිටීමට පවා අපහසු ආකාරයට මත්පැන් පානය කර තිබූ බවත්, එසේහෙයින් 2024.04.07 වන දින පැය 17.00ට එම ස්ථානයේදී බීමත්ව රිය පැදවීම, පොලිස් අණනොතකා ධාවනය කිරීම, යන වරදවල් කියාදී පොලිස් සැරයන් 45411 සේනානායක යන අය විසින් වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගෙන ඇති බවත්, පොලිස් ස්ථානය වෙත රැගෙන පැමිණි පසුව ශ්වසන නාල පරික්ෂණයක් සිදුකොට ඇති බවත්, එහිදී වින්දිත පාර්ශවය වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අයගේ රුධිරයේ මිලි ලීටර් 100ක ඇලුකොහොල් ග්‍රෑම්ස් 0.08ට වැඩි බව අනාවරණය වූ බවත් ඉහත කී සටහනෙහි වැඩිදුරටත් සඳහන්ව ඇති බව නිරීක්ෂණය වේ.

තවද, 1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක විසින් මැදවච්චිය පොලිස් ස්ථානයේ රථවාහන දෛනික තොරතුරු සටහන් පොතේ 2024.04.08 වන දින පැය 9.10ට පිටුව 97 සහ ඡේදය 199 යටතේ වැටලීම් සටහන් ඇතුලත් කොට ඇත. මෙකී සටහනෙහි 1 වන වගඋත්තරකරු විසින් සටහන් කොට ඇත්තේ, අදාළ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා තමා 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල නිලධාරියා සමඟ ලොරි රථයේ රියදුරු අසුන දෙසට ගමන් කළ බවත්, එම අසුනේ සිටි රියදුරු ලොරියේ දොර විවෘත කිරීම සඳහා ඉඩනොදුන් බවත්, ඒ

සමගම වම්පස සිට රිය සහායක පලා යාමට උත්සාහ කළ බවත්, ඒ අවස්ථාවේදී පොලිස් කොස්තාපල් 75324 කපිල නිලධාරියා වම් පසට ගොස් රිය සහයක අත්අඩංගුවට ගත් බවත්, ඒ අවස්ථාවේදී රියදුරු ද රිය සහයකගේ දොර පැත්තෙන් පැන යාමට උත්සාහ කිරීමේදී ඔහු මුනින් අතට ජියර් පොල්ල උඩට තුන් හතර වතාවක් වැටුනු බවත්, ඒ අවස්ථාවේදී කෙසේ හෝ ඔහු පසෙකට ඇද දමා පොලිස් සැරයන් 45411 සේනානායක වන තමා විසින් ලොරි රථයේ රියදුරු වූ වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගනු ලැබූ බවත් ය.

වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීම සිදු වූ 2024.04.07 වන දින මැදවච්චිය පොලිස් ස්ථානයේ උප සේවය භාරව කටයුතු කළ පොලිස් කොස්තාපල් 57319 දිසානායක නිලධාරියා විසින් වින්දිත පාර්ශවය වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය භාරගෙන ඇති අතර, භාර ගැනීමේදී ඔහුව පරික්ෂා කොට එම පරික්ෂාවේදී සැකකරුගේ බෙල්ලේ සීරිම් තුවාලයක් ඇති බවට සටහන් කර ඇති බව පොලිස් ස්ථානයේ උධෘත අනුව නිරීක්ෂණය වේ.

එසේම, මැදවච්චිය පොලිස් ස්ථානයේ රථවාහන දෛනික තොරතුරු සටහන් 1 පොතේ 2024.04.07 වන දින පැය 22.45ට පිටුව 277 සහ ඡේදය 679 යටතේ පොලිස් කොස්තාපල් 57319 දිසානායක නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව වින්දිත පාර්ශවය වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය විසින් යටි බඩේ කැක්කුමක් ඇති බව පැවසීම හේතුවෙන් ඔහුව මැදවච්චිය රෝහල වෙත රැගෙන යාම සඳහා පොලිස් සැරයන් 47795 යසපාල නිලධාරියා වෙත භාර දී ඇති බව පෙනී යයි.

තවද, මැදවච්චිය පොලිස් ස්ථානයේ රථවාහන දෛනික තොරතුරු සටහන් 1 පොතේ 2024.04.08 වන දින පැය 07.05ට පිටුව 92 සහ ඡේදය 172 යටතේ පොලිස් සැරයන් 47795 යසපාල නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව වින්දිත පාර්ශවය වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය මැදවච්චිය රෝහල වෙත රැගෙන යාමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර මහ රෝහලේ වාට්ටු අංක 11හි බීඑච්ටී 44006/24 යටතේ ඇතුළත් කර ඇති බව ද නිරීක්ෂණය වේ.

එලෙස අනුරාධපුර ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී කැබිතිගොල්ලෑව කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ සේවයේ නියුතු පො.සැ. 47716 සුබසිංහ නම් නිලධාරියා විසින් 2024.04.08 වන දින වින්දිත පාර්ශවය වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අයගෙන් ප්‍රකාශයක් ලබාගෙන ඇති බව කැබිතිගොල්ලෑව කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ 2024.04.08 වන දින පැය 22.30ට පිටුව 39 සහ ඡේදය 31 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි. එහිදී යතුරු පැදියකින් පැමිණි පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් වින්දිත පාර්ශවය වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය ගමන් කළ ලොරි රථය මාර්ගයේ නතර කළ බවත්, ඔහුගේ අසුන අසලට පැමිණි පොලිස් නිලධාරියා විසින් ලොරි රථයේ දොර විවෘත කර ඔහුව පිටතට ගෙන ඔළුවට අතින් පහරදුන් බවත්, ඒ අවස්ථාවේදී වින්දිත පාර්ශවය බිම වැටුණු බවත්, පොලිස් නිලධාරියා විසින් වින්දිත පාර්ශවය නැගිට්ටවා පොලිස් නිලධාරියාගේ කකුළ නවා දණ හිසෙන් වින්දිත තැනැත්තාගේ පුරුෂ ලිංගය වෙත පහරවල් 04 ක් 05ක් පමණ එල්ල කළ බවත්, නැවතත් ලොරි රථයට හේත්තු කර වින්දිත තැනැත්තාගේ තට්ටම් ප්‍රදේශය වෙත පහරවල් 04 ක් 05ක් පමණ එල්ල කළ බවත් වින්දිත තැනැත්තා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, අනෙක් පොලිස් නිලධාරියා විසින් ද වින්දිත තැනැත්තාගේ බෙල්ලෙන් අල්ලා ඔළුවට පහර දුන් බවත්, එකී පහරදීම් හේතුවෙන් ඔහු පොලිස් නිලධාරීන් පැමිණි යතුරු පැදිය අසලට වැටුනු බවත්, පසුව එම පොලිස් නිලධාරියා විසින් වින්දිත තැනැත්තාගේ කොන්ද ප්‍රදේශය වෙත පා පහර කිහිපයක් එල්ල කළ බවත්, වින්දිත තැනැත්තාගේ දෑත් පිටුපසට කර පොලීසියේ නලාව සවි කරන පටයෙන් බැඳ වාහනය තුළට තල්ලු කළ බවත්, දෑත් බැඳ තිබූ නිසා අසුන වෙත යාමට නොහැකි වූ බැවින් ඔහුගේ කොණ්ඩයෙන් ඇද අසුනෙහි වාඩි කරවූ බවත් වින්දිත පාර්ශවය විසින් අදාළ ප්‍රකාශයෙහි සඳහන් කර ඇත. එලෙස පහරදීමෙන් අනතුරුව මුලින් පහරදීම් සිදු කළ නිලධාරියා විසින් වින්දිත තැනැත්තාගේ ලොරි රථය පදවාගෙන ඔහුව පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත්, පැමිණෙන අතරතුර දී වල්පොළ පාසල අසලදී ලොරි රථය පදවාගෙන ආ පොලිස් නිලධාරියා විසින් නැවතත් වින්දිත තැනැත්තගේ ඔළුවට පහරදුන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

අනුරාධපුර මහ රෝහලේ වින්දිත තැනැත්තාගේ ආරක්ෂක රාජකාරී සිදු කළ නිලධාරීන් වන පො.සැ.47795 යසපාල සහ පො.සැ. 67625 සම්පත් යන නිලධාරීන් විසින් ස්ථානාධිපතිතුමාගේ නියෝග හා උපදෙස් පරිදි වින්දිත තැනැත්තා හට 2024.04.24 වන දින පැය 09.00ට මැදවච්චිය මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටින ලෙසට දන්වා ඇප බැඳුම්කර පෝරමය අත්සන් කරවාගෙන වින්දිත තැනැත්තා 2024.04.08 වන දින පැය 05.30ට පොලිස් ඇප මත මුදා හැර ඇති බව පොලිස් උධෘත අනුව නිරීක්ෂණය වේ.

2024.04.10 වන දින 4 වන වගඋත්තරකරු වන මැදවච්චිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් අංක බි 341/2024 යටතේ වින්දිත පාරිශවය විසින් පොලිස් සංඥා නොතකමින් මත්පැන් පානය කර අපරික්ෂාකාරී ලෙස රිය පැදවීම සම්බන්ධයෙන් මැදවච්චිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව පෙනී යයි.

වින්දිත තැනැත්තා වන ඒ.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය සහ ඔහු සමඟ ලොරි රථයේ ගමන්ගත් පියසිරිගේ සහන් මලීෂ පියසිරි යන අය වෙතින් 2024.04.17 වන දින කොමිෂන් සභාව විසින් ප්‍රකාශ සටහන් කරගැනීමේ දී අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී ඔවුන් දෙදෙනා මත්පැන් පානය කර සිටි බවත්, ඔවුන් ගමන්ගත් ලොරි රථය පිටුපසින් රථවාහන රාජකාරියෙහි නිරත වූ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු යතුරු පැදියකින් පැමිණෙන බව දුටු බවත් දෙදෙනා විසින් ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පොලිස් සංඥා වලට අවනත නොවී අපරික්ෂකාරී ලෙස බීමත්ව රිය ධාවනය කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීම නීතියට අනුව සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක සහ 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල යන නිලධාරීන් දෙදෙනා විසින් වින්දිත පාර්ශවය වෙත පහරදුන් බවට පැමිණිල්ලේ සඳහන් වන බැවින් වින්දිත පාර්ශවයට අදාළ අංක 1304/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුරාධපුර ශික්ෂණ රෝහල වෙතින් කැඳවා ඇති අතර, එමගින් පහත කරුණු අනාවරණය වේ.

එකී අංක 1304/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව වින්දිත පාර්ශවය වන ජ්.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ යන අය 2024.04.08 වන දින පෙ.ව.12.30ට අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත ඇතුළත් කර ඇති බවත්, 2024.04.10 වන දින පෙ.ව. 10.30ට අධිකරණ වෛද්‍යවරිය විසින් වින්දිත තැනැත්තා පරීක්ෂාවට ලක් කර ඇති බවත් නිරීක්ෂණය වේ. එසේම, එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය තුළ 2024.04.07 වන දින ප.ව. 4ට පමණ මැදවච්චියේදී තමන් පැදවූ ඩිමෝ බට්ටා ලොරි රථය, නිල අඳුම් සැරසී යතුරු පැදියකින් පැමිණි පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් නතර කර, ලොරි රථයෙන් පිටතටගෙන පහරදුන් බවත්, "මාව වාහනයෙන් ඇදලා අරගෙන, වාහනේට තද කරගෙන දණහිසෙන් මගේ වෘෂණ කෝෂ ප්‍රදේශයට ගැහුවා" යනුවෙන්ද සඳහන් කොට ඇති බවත් පෙනී යයි.

තවද, එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල යටතේ තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය, දිසාව සහ ස්ථානය යටතේ පහත කරුණු සඳහන්ව ඇත.

01. According to the notes in the BHT, the left testes is ruptured with a large hematoma. The testes is non-viable due to ischemia (reduced blood supply). Immediate left side orchiectomy (surgical removal of the testes) is done.

02. Linear abrasion 4cm size on lower 1/3rd of the front neck.

ඉහත කී තුවාල අංක 01 යටතේ ඇඳඉහපත් වාර්තාව අනුව වම් වෘෂණ කෝෂයට රුධිර සැපයුම අඩුවීම හේතුවෙන් වෘෂණ කෝෂය සක්‍රිය නොවීම මත වම් පැත්තේ වෘෂණ කෝෂය ශල්‍ය කර්මයක් මගින් ඉවත් කර ඇත යනුවෙන් දක්වා ඇති අතර, එය සාමාන්‍ය තත්ව යටතේ මරණය සිදු කිරීමට ප්‍රමාණවත් තුවාලයක් වන බව ද අධිකරණ වෛද්‍යවරිය විසින් සඳහන් කර ඇත. එසේම, තුවාල අංක 02 යටතේ බෙල්ලේ ඉදිරිපස පහළ සෙන්ටි මීටර් 4ක සීරීමක් ඇති බව දක්වා ඇති අතර, එය බරපතළ නොවන තුවාලයක් බවද අධිකරණ වෛද්‍යවරිය විසින් සඳහන් කර ඇත.

තවද, මෙම තුවාල ද්විත්වය මොට ආයුධ වලින් සිදු කර ඇති තුවාල වන බවත්, එකී තුවාල රෝගියා විසින් ලබාදෙන ලද ඉතිහාසය සමඟ ගැලපෙන බවත් අධිකරණ වෛද්‍යවරිය විසින් වැඩිදුරටත් වින්දිත පාර්ශවයේ අධිකරණ වෛද්‍ය වාර්තාව තුළින් දක්වා ඇත. මේ අනුව රෝගියා විසින් ලබාදෙන ලද ඉතිහාසය තුළ සඳහන්ව ඇත්තේ ඔහු හට පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පහරදීම් සිදු කළ බවට වන හෙයින් පොලිස් නිලධාරීන්ගේ පහරදීම් හේතුවෙන් අදාළ තුවාල සිදු ව ඇති බව තහවුරු වේ.

එසේම, අත්අඩංගුවට ගැනීම සිදු වූ 2024.04.07 වන දින වින්දිත පාර්ශවය සමඟ ලොරි රථයේ ගමන් ගත් ඔහුගේ මිතුරා වන පියසිරිගේ සහන් මලීෂ පියසිරි යන අය විසින් 2024.04.17 වන දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදී ඇති අතර, එකී ප්‍රකාශය මගින්ද ප්‍රකාශ කර ඇත්තේ, වින්දිත පාර්ශවය වන ජ්.එම්.ආර්. දිලීෂ සංගීත් රූපසිංහ හට ඔහුව අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරීන් විසින් පහරදුන් බව තමා දුටු බවයි.

මෙම පැමිණිල්ලට අදාළව දෙපාර්ශව කැඳවා 2024.08.08 වන දින කොමිෂන් සභාව හමුවේ පරීක්ෂණයක් පවත්වා ඇත. එහිදී වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත්තේ ඔහුට 1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක හා 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල යන පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදුකරන ලද බවයි.

1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක යන අය තමාව අත්අඩංගුවට ගනු ලැබූ බවත්, ඔහුගේ නිල කමිසයේ තිබූ ලෙනාඩ් එක අරගෙන තමාගේ අත්දෙක පිටුපසට කර බැද තමාට ඔළුව පිටුපස බෙල්ල ප්‍රදේශයට පහර කිහිපයක් ගසන ලද බවත්, පසුව ඔහු තමාව තම වාහනයේ බදට හේත්තු කර ඔහුගේ දණහිස නවා යටිබඩ ප්‍රදේශයට පහර කිහිපයක් ගැසූ බවත්, මෙම නිලධාරියා තමාව වාහනයේ දොර ළගට ගෙන ගොස් දොර හා වාහනය අතර තබා දොර වසා තද කළ බවත්, පසුව තමාගේ කොණ්ඩයෙන් ඇද එළියට ගෙන වාහනයට තල්ලු කළ බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

එමෙන්ම, 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල යන අය තමාගේ ඔළුවට පහරක් ගැසූ බවත්, එවිට තමා බිම වැටුනු බවත්, බිම වැටුනු පසු ඔහු තමාට පයින් පහර කිහිපයක් ගසන ලද බවත්, එම පහරවල් තම පිටට, කකුල්වලට හා බඩට වැදුනු බවත් වින්දිත පාර්ශනව විසින් වැඩිදුරටත් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ප්‍රකාශ කර ඇත.

එහෙත් එකී පරීක්ෂණය සඳහා සහභාගී වූ වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගනු ලැබූ 1 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 45411 සේනානායක හා 2 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 75324 කපිල යන පොලිස් නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇත්තේ පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලබන බවත්, වින්දිත තැනැත්තා හට කිසිදු පහරදීමක් කර නොමැති බවත්, ඔවුන් විසින් අත ගැටගසා ලොරියට දමාගැනීම පමණක් සිදු කළ බවත් ය.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේදී 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් වින්දිත පාර්ශවය වෙත පහරදීම් සිදු කර ඇති බවත්, 1 වන වගඋත්තරකරුගේ පහරදීම් හේතුවෙන් වින්දිත තැනැත්තාගේ වම්පස වෘෂණ කෝෂය ශල්‍ය කර්මයක් මගින් ඉවත් කිරීමට සිදු වී ඇති බවත්, එය සාමාන්‍ය තත්ත්ව යටතේ මරණය සිදු කිරීමට ප්‍රමාණවත් වන තුවාලයක් බවත් වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 1304/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව තහවුරු වේ. ඒ අනුව 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බැවින් මෙම සිද්ධිය සිදුවන අවස්ථාවේදී වැඩබලන ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කළ 3 වන වගඋත්තරකරු, 1 වන සහ 2 වන වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීමෙන් බැඳෙන බවත්, ඉහත කී 2024.04.07 වන දින උප සේවය භාරව කටයුතු කළ පොලිස් කොස්තාපල් 57319 පී.බී. දිසානායක යන අය විසින් සඳහන් කර ඇති පරිදි වින්දිත පාර්ශවය රෝහල වෙත රැගෙන යාම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදීමට 3 වන වගඋත්තරකරු අපොහොසත්ව ඇති බැවින් සිය වෘත්තීමය වගකීම් නිසි පරිදි ඉටු නොකිරීම සම්බන්ධයෙන් ද වගකීමෙන් බැඳෙන බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 4 වන වගඋත්තරකරු විසින් 3 වන වගඋත්තරකරු වැඩබැලීම සඳහා පත් කර අදාළ සිද්ධිය සිදු වූ 2024.04.07 වන දින දහවල් 12ට පමණ සහකාර පොලිස් අධිකාරීවරයා වෙත දන්වා අවසර ලබාගෙන නිවාඩු ලබාගත් බවට සඳහන් කර ඇති බැවින් සහ ඔහු විසින් ප්‍රමාද වී හෝ වින්දිත පාර්ශවය රෝහල්ගත කිරීම සම්බන්ධයෙන් දුරකථන මාර්ගයෙන් උපදෙස් ලබාදීමට කටයුතු කර ඇති බැවින් මෙම සිද්ධියට අදාළව ඔහු වෙත වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරන බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

01. 01 වන වගඋත්තරකරු විසින් රුපියල් ලක්ෂ තුන (රු.300,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 02 වන වගඋත්තරකරු විසින් රුපියල් ලක්ෂ දෙක (රු.200,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

03. 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

04. 1 වන වගඋත්තරකරුගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් 1994 අංක 24 දරණ වධහිංසාව සහ අනෙකුත් කෲර අමානුෂික අවමන් සහගත සැලකීම් වැලැක්වීමේ සම්මුති පනත යටතේ නීති කෘත්‍යයක කටයුතු කිරීම සඳහා විශේෂ විමර්ශන අංශය, ශ්‍රී ලංකා පොලිසිය මගින් විමර්ශනය කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. ජූ . 15 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්-: 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය ,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් වින්දිත පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.